www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහ ජනයා වඩාත් උග්‍ර ආර්ථික කැප කිරීමක් කල යුතුයයි ශ්‍රී ලංකාවේ ධනපතියෝ ඉල්ලා සිටිති

## Sri Lankan elites press for greater economic sacrifice

**නන්ද වික්‍රමසිංහ**

**2009 මැයි 23**

බෙදුම්වාදී එල්ටීටීඊ සංවිධානය පරාජය කිරීමෙන් ඉක්බිත්තේ ශ්‍රී ලංකාවේ මහ සංගත ධනපති පාලක පන්තිය එරට පීඩිත ජනතාවගෙන් කොතරම් දරුනු කැප කිරීමක් ඉල්ලා සිටිත් ද යන්න පිලිබඳ න්‍යායපත්‍රයක් ද අයිලන්ඩ් නම් පුවත්පතේ කතුවැකියෙන් පසුගිය මැයි 21 දා ඉදිරිපත් කරන ලදී.

සඳුදා හමුදාව එල්ටීටීඊ සටන්කරුවන්ගේ අන්තිම කඳවුර ද විනාශ කර දැමූ පසුව මාධ්‍යයන් හා සිංහල වර්ගවාදී කන්ඩායම්වල ආධාරයෙන් රට පුරා කොඩිය-වනන විජයොත්සව පවත්වා තිබේ. අගනුවර වීදි පුරා රාජපක්ෂගේ ද ඔහුගේ මලයා වන ආරක්ෂක ලේකම් ගෝඨාභයගේ ද පින්තූර සහිත විශාල පෝස්ටර් මෙසේ නිවේදනය කරයිඃ "අප ගලවා ගත් මහින්ද රාජපක්ෂ රජතුමා"

ඒ කෙසේ වෙතත්, ද අයිලන්ඩ් පුවත්පත මෙසේ ප්‍රකාශ කලේ යඃ "ජය පානය උවමනා නැති තරම් දුරට ඇදී යන පාටයි." දේශප්‍රේමයට නම් තැනක් තිබෙන බව පිලිගනිමින් එම පුවත්පත මෙසේ ද කීයඃ "රට මුහුන දී සිටින්නේ යෝධ පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරන වියදමකට ය. දැනට ම අන්තයට ම ලේ ගලා තිබෙන ජාතික ආර්ථිකයට එය දරුනු බරක් වනු ඇත."

පුවත්පතේ නොඉවසිල්ල පිලිබිඹු කරන්නේ ජාතික ආර්ථිකය අගාධයක මුවවිටේ සැලෙමින් පවත්නා බවය. රාජපක්ෂ එල්ටීටීඊය පරාජය කිරීම සඳහා ගතවූ තුන් වසර තුල යුද වියදම් දෙගුන කල අතර අය වැය හිඟය පියවීම සඳහා රට බරපතලව නය කලේ ය. දැන් ශ්‍රී ලංකාව ගෝලීය මූල්‍ය අර්බුදයක් හා අවපාතයක් මැද්දැවේ ගෙවුම් ශේෂ අර්බුදයකට මුහුන දී සිටී.

ශ්‍රී ලංකාවේ මහ බැංකුව මෙම සතියේ වාර්තා කලේ පෙබරවාරියේ ඩොලර් මිලියන 1,117කින් එරට විදේශ සංචිත එක් මාසයක් ඇතුලත මාර්තු වන විට ඩොලර් මිලියන 946.7 දක්වා පහත වැටුන බවය. මාර්තු අන්තිම වන විට එරටට තිබුනේ යාන්තම් සති 5ක ආනයන පිරිමසා ගැනීමට සෑහෙන විදේශ විනිමය ප්‍රමානයක් පමනි. ආර්ථිකය අඩාල වීම දිගින් දිගට ම සිදු වන තතු තුල බැංකුව බ්‍රහස්පතින්දා පොලී රේට්ටු 0.25කට කපමින් අවුරුදු දෙකකින් පහත ම මට්ටමට ඇද දැමුවේ ය.

රටවල නය යෝග්‍යතාව නිර්නය කරන ප්‍රධාන ලෝක ආයතනය වන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් මේ සතියේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය නය බැඳුම්කර වල තත්වය ඍන මට්ටමට සලකුනු කලේ ය; ආන්ඩුව ආදායම වැඩි කර ගැනීමට ද වියදම කැපීමට ද පියවර ගතයුතුව ඇතැයි එය අනතුරු ඇඟවීය. දැන් ලංකාවේ තත්වය "බී" දක්වා පහත වැටී තිබේ. එනම් ආයෝජන යෝග්‍ය මට්ටමේ සිට තට්ටු පහක් පහත වැටීමකි.

ආන්ඩුවේ අයවැය හිඟය 2008 වර්ෂයේ දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 8ක්ව පැවැති අතර රාජ්‍ය නය දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 81 ඉක්මවිය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මේ රට මෙතෙක් ඉල්ලා ඇති විශාලතම නය ප්‍රමානය වන ඩොලර් බිලියන 1.9ක් ලබා ගැනීම සඳහා එම ආයතනය වෙත හිඟන කොලපත රැගෙන යාමට ආන්ඩුවට සිදු වී තිබේ. මෙම නය ලබා දීමට නම් ආන්ඩුව දරුනු කප්පාදු ක්‍රියාත්මක කල යුතු යයි මූල්‍ය අරමුදල අනිවාර්යයෙන්ම නියම කරනු ඇත. ඒ මදිවාට ලංකාව ඇතුලත චීනයේ බලපෑම වැඩී යාමට එරෙහිව ලංකාවට දේශපාලන බලපෑම් දැමීම සඳහා ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය මෙම නය මුදල ද නොදී හිර කරගෙන සිටිති.

(ලෝක ධනවාදයේ මුඛ්‍ය කථකයෙක් වූ) වෝල් ස්ට්‍රීට් ජර්නල් සඟරාව පල කල ලිපියක් ජාත්‍යන්තර ප්‍රාග්ධනය ලංකාව දැක ගත්තේ කොයි ආකාරයකට ද යන්න ඉදිරිපත් කලේ ය. විවෘත ආර්ථික ප්‍රතිසංස්කරනයන් 'ඇන හිටුවමින්' ක්‍රියාත්මක කරන්නේ යයි ද "ආන්ඩුවේ වියදම් වැඩි කොට අය වැය හිඟය සහ උද්ධමනයට බාන් කඩාගෙන වල්මත් වීමට ඉඩ පාදන්නේ ය" යි ද චෝදනා කල එම සඟරාව "යුද්ධමය ජයග්‍රහනය සාමයක් හා වේගවත් වර්ධනයක් උදා කර දෙනු ඇතැයි ශ්‍රී ලංකාව තුල පැතිර පවත්නා හැඟීම" වනාහී "හුදෙක් ආශාපූර්න සිතිවිල්ලක්" පමනක් යයි පෙන්වා දුනි. වෝල් ස්ට්‍රීට් ජර්නලය කියා සිටින්නේ වෙලඳ හා විදේශ ආයෝජන සඳහා බාධාවන් ඉවත්

කල යුතු බවත්, "රාජ්‍ය වියදම් අංශයේ ගැඹුරු ප්‍රතිසංස්කරන කල යුතු" බවත් ය. මින් දෙවැන්නෙහි තේරුම වන්නේ සහනාධාර කපා, මිලිටරි වියදම් කපා රට තුල ජාවාරම් සඳහා රෙගුලාසි ඉවත් කිරීම - ව්‍යාපාර පවත්වාගෙන යාමේ වියදම කපා දැමීම (ධනපතියන්ට බදු සහන යනාදිය) යි.

ද අයිලන්ඩ් පුවත්පතේ කතුවැකිය අවධාරනය කරන සැබෑ කාරනය නම් ආර්ථික අර්බුදයේ බර මහජනතාව මතට පැටවීම සඳහා තවදුරටත් කල් මැරිය යුත්තේ නැතැයි යන්න ය. "යුද්ධමය ජයග්‍රහනය පිලිබඳ ජාත්‍යානුරාගී උන්මාදය පරෙස්සමින් පාලනය කොට හරවා යැවිය යුතතේ ජාතිය ගොඩ නැගීමේ කර්තව්‍ය කරාය"යි එය ආන්ඩුවට අවවාද කර සිටයේ ය.

'සැනකෙලින විනෝදවන්නන් දැන් කල යුතුව ඇත්තේ ආරක්ෂක හමුදා රට වෙනුවෙන් කල ආත්ම ත්‍යාගී කැපවීමට සරිලන ලෙස කැපවී ගැනීම යයි දැන් ඔවුන්ට කිව යුතුව ඇත. දැන් කාලය එලඹ ඇත්තේ ආර්ථික පෙරමුනේ රට ආරක්ෂා කිරීමට ය... අවශ්‍යව ඇත්තේ ජාත්‍යානුරාගය ඔහේ පෙනුමට ප්‍රදර්ශනය කිරීම නොවේ. රට වෙනුවෙන් කැප කිරීම් කිරීම සඳහා නොසැලෙන සූදානම ය. තනිකර ම මහන්සි වී අමාරු වැඩට කර ගැසීම ය."

දක්ෂිනාංශික අයිලන්ඩ් පුවත්පත සෑම විටම යුද්ධයට පක්ෂපාතීව සිටි අතර එල්ටීටීඊය පරාජය කිරීමේ වර්ගවාදී ගෝසාවේ කොටස්කරුවෙකු ද විය. දශක ගනනාවක් තිස්සේ දෙමල ජනතාවට නිල වශයෙන් ම කරන ලද වර්ගවාදී වෙනස්කම් මගින් අවුලුවා ගන්නා ලද වර්ගවාදී යුද්ධය පසුගිය අවුරුදු 26ක් තිස්සේ පැවැති සෑම ආන්ඩුවක් විසින් ම වැඩ කරන ජනතාව වර්ගවාදී ලෙස බෙදා සමාජ අසහනයට එරෙහි විරෝධය යටපත් කිරීම සඳහා යොදාගන්නා ලදී.

දැන් ද අයිලන්ඩ් පුවත්පත ද, එය විසින් නියෝජනය කරනු ලබන ජාවාරම්කාර ධනපතීන් ද මහජනතාව "කැපකිරීම් කිරීම සඳහා නොසැලෙන සූදානමක් ඇති කර ගත යුතු ය"යි කියා ය. යුද්ධය වෙනුවට ඔවුන් දැන් ඉදිරිපත් කරන හේතුව නම් "රට ආර්ථික සමබරතාවයක" තැබීම ය. ඒ සඳහා වැඩ කරන ජනතාව "නොසැලී සූදානම් විය යුතුව ඇත." - වෙනත් වචනවලින් කිව හොත් මින් අදහස් වන්නේ මහා කොම්පැනිවල ලාභ පුම්බා ලීම සඳහා කම්කරුවන් තියුනු ආර්ථික කප්පාදු බාර ගැනීම කල යුතුව ඇතැයි යන්නය.

රාජපක්ෂ වැඩ පිලිවෙල හොඳට දැන සිටී. පසුගිය බ්‍රහස්පතින්දා කල තමාගේ "විජයග්‍රාහී" කතාවේ දී ඔහු කියා සිටියේ මහ ජනතාව ජාතිය ගොඩ නැගීමේ කර්තව්‍යයට "මුහුන දිය යුතු" බව ය. සෑම කෙනෙකු ම දැන් කොතරම් කැපවී ගත යුතු දැයි තහවුරු කිරීම සඳහා රාජපක්ෂ හමුදාවේ වීරත්වය පිලිබඳව දිගින් දිගටම කතා කලේ ය. එහෙත් මෙම "වීරයන්ගෙන්" බහුතරය වනාහී ගම්වල හෝ නගරවල රැකියා සොයාගැනීමට බැරිකම නිසා ද තමන් ජීවත්වන අතිශය දිලිඳු තත්වය නිසා ද හමුදා සේවයට බඳවා ගනු ලැබූ ගම්බද දුප්පත් තරුනයන් ය. සිහල, දෙමල, මුස්ලිම් සෑම ජාතියකම වැඩ කරන ජනතාවට - තමන්ගේ කුස පොත්තට දැරිය නොහැකි තරම් "පටි තද කර ගැනීමෙට" දැනට ම සිදුවී තිබේ.

මෙම තතු තුල සිත්ගන්නා කරුනක් නම් 'ද අයිලන්ඩ්' කතු වැකිය වෝල් ස්ට්‍රීට් ජර්නලය ඉදිරිපත් කල එක නිර්දේශයක් සඳහන් නොකිරීම ය. ඒ වනාහී යුද වියදම් අඩු කිරීම යි. ඒ වෙනුවට ද අයිලන්ඩ් මෙසේ කියා සිටියේ ය. "ලඟදී ම හමුදා භටයන් සේවා මුක්ත කිරීම කිරීම අපහසු වන නිසා බොහෝ කලක් ගතවෙන තෙක් ම යුද වියදම් අඩුකිරීමක් අපේක්ෂා කල නොහැකි ය. ඒ වෙනුවට ලඟදී විමුක්ත කර ගන්නා ලද ප්‍රදේශ මුර කිරීම සඳහා තවතවත් අවශ්‍ය වන නිසා තවතවත් හමුදා භටයන් හා පොලිස් භටයන් බඳවා ගැනීම සිදුවනු ඇත."

ජනගහනයට අනුපාත වශයෙන් ගතහොත් ලෝකයේ විශාලම හමුදාවක් සිටිනා රටකි ලංකාව. දැනට ම උතුරු පලාත්වල ක්‍රියාත්මක කර ඇති අයුරු ම වඩා මෑත දී අල්ලා ගත් උතුරු ප්‍රදේශයේ දී ද ආන්ඩුව සූදානම් වන්නේ හමුදා පාලනයකට නොඅඩු තත්වයක් පවත්වා ගැනීමකි. මෙවන් වැඩ පිලිවෙලක් අවශ්‍ය වීමෙන්ම පැහැදිලි වන කරුන නම් යුද්ධය කරගෙන යන ලද්දේ ම "ත්‍රස්තවාදී එල්ටීටීඊයෙන් " දෙමල ජනයා විමුක්ත කර ගැනීම නොව දිවයින පුරාම කොලඹ ධනපති පන්තියේ අනසක පතුරුවා ලීම සඳහා බවය.

හමුදාවේ සංඛ්‍යාව තවතවත් ඉහල නැංවීමේ අරමුන වන්නේ හුදෙක් හමුදාව මෙතෙක් ලද ජයග්‍රහනයන් තහවුරු කර ගැනීම පමනක් නොවේ. ආන්ඩුව වැඩ කරන ජනතාවට එරෙහි ප්‍රහාරයක් අරඹත්ම අනිවාර්යයෙන්ම පුපුරා යනු ඇති සමාජ අසහනය මර්දනය කිරීමට සූදානම් වීම සඳහා ද වේ. හමුදාව තවතවත් පලල් කොට පවත්වාගෙන යනවා පමනක් නොව - පොලිස් - රාජ්‍ය පියවර අඩු කිරීමක් නොවනු ද ඇත.

මුර්ග හදිසි නීතිය, මාධ්‍ය මර්දනය, සිර කඳවුරු සහ ඝාතක සේනාංක තවතවත් තර කෙරෙනු ඇත.

ද අයිලන්ඩ් පුවත්පතේ ලිපියේ ඉවසීම් රහිත භාවය ගලා එන්නේ කම්කරු පන්තියට එරෙහි මුර්ග මර්දනයක් වහාම ඇරඹෙන බවත් එය කල් නොයවා ම ක්‍රියාත්මක කිරීමට ධනපති ප්‍රභුව සූදානම් වන බවත් ය.

© www.wsws.org